# 2016.08.05 දින කොළඹ මාලිගාවත්ත, ප්‍රදීපා මාවතේ "සියසෙත සෙවණ" නව නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පවරමින් අදහස් දැක්වූ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා

රාජපක්ෂ රෙජිමය මේ කොළඹ නගරයේ පුංචි මිනිසුන්ව ගෙවල්වලින් එළවා දමා කැසිනෝ ආර්ථිකයක් ඇති කරන්න උත්සාහ කළා. ඒත් ජනවාරි අටවැනි දා ඔබ සියලු දෙනාම එකතු වී කැසිනෝ ආර්ථිකයත්, රාජපක්ෂ රෙජිමයත් එළවා දමා ත්‍රිරෝද ආර්ථිකය ආරක්ෂා කළා. අප අද මෙතැනට පැමිණ සිටින්නේ, එම ත්‍රිරෝද ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කොට, ඔබට දියුණුවෙන්නට උපකාරී වන මේ මෙගා පොලිස් වැඩසටහනට ඇතුළත් තවත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටයි.

වි.ඒ. සුගතදාස, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, වින්සන්ට් පෙරේරා යන මැතිතුමන්ලා මේ නගරය පුංචි මිනිසුන්ගේ නගරයක් බවට පත් කළා. ඔවුන්ට ජීවත්වීම සඳහා ආධාර උපකාර කළා. රාජපක්ෂ රෙජිමය කටයුතු කළේ. එම තත්ත්වය නැති කරන්ටයි මේ රටේ යහපාලනය ආරක්ෂා කිරීමට පාරට බැස්සේ ඔබතුමන්ලයි. මේ මුඩුක්කුවල ඉන්න ජනතාවයි. ත්‍රිරෝද රථයක් පැදවූ, එසේත් නැත්නම් පදිකවේදිකාවේ බඩු විකුණපු ජනතාවයි. ඒ පොඩි මිනිසුන්ගේ බලයයි. ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ඡන්ද බලයේ වැඩිම වටිනාකම තේරුණේ පොඩි මිනිසුන්ටයි. ලොකු මිනිසුන් ගිහින් මුක්කු ගහනකොට පොඩි මිනිසුන් හැමදාම එකතැන සිටියා. අපි ඒ තත්ත්වය අමතක කරලා නැහැ. ඒ ජනතාව අමතක නොකරන, ජනතාව ජීවත් කරවන එක ව්‍යාපෘතියක් වන මේ බටහිර මෙගා පොලිස් ව්‍යාපෘතිය අපි ආරම්භ කළේ ඒ නිසයි.

කොළඹ ඉන්දියන් සාගරයේ මැද තිබෙන මැද තිබෙන විශාලතම නගරය බවට පත් කිරීම, බස්නාහිර පළාතේ ලක්ෂ 85 ක ජනගහණයකට පහසුකම් සැපයීම, සාමාන්‍ය ජනතාවට නිවාස ලබා දීම, ඔවුන්ගේ ජීවිත දියුණු කරමින් අලුත් ආර්ථිකයක් ගොඩනැගීම, කැසිනෝ උවදුර දුරුකිරීම අපේ ඒ නව ව්‍යාපෘතියට ඇතුළත් වෙනවා. එදා ඒ අය වරාය නගරය විකුණන්න ගියේ පිටරටින් ආපු ධනවතුන්ටයි. එදා ගෙවල් හැදුවේ නැහැ ඒ මුදල් හයිට් හෝටලයට වියදම් කළා. අද අපට ඒ ණයත් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. රාජපක්ෂවරු ජනතාවට කළේ කුමක්ද? ජීවන මාර්ගයන් නැති කළා. නමුත් අපි බලන්නේ මේ ව්‍යාපෘතිය තුලින් මේ ජනතාවට නිවාස පහසුකම් ලබාදීම පමණක් නොව අළුත් ආර්ථික රටාවක් ඇති කිරීමටයි. මහා පරිමාණයේ විදේශ ආයෝජකයන්ට පමණක් නොව අපේ කුඩා ව්‍යාපාරිකයින්ටත් යම් කිසි මුදලක් උපයා ගන්නට අවස්ථාව සලසා දෙන්නටයි. දක්ෂ තරුණ තරුණියන්ට තවදුරටත් ඉදිරියට යෑමේ අවස්ථාව සලසා දීමටයි. තමන් දක්ෂ නම් හැකියාව තිබෙනවා නම් මීට වඩා වැඩි මුදලක් උපයා ගන්නට පුළුවන්. අපි බිහි කිරීමට යන්නේ අන්න එවැනි දක්ෂයන්ගෙන් පිරුණු නගරයක්.

ඒ නගරය බිහිකිරීමේ ප්‍රධාන වැඩකොටස අපි චම්පික රණවක ඇමතිතුමාට භාරදී තිබෙනවා. එතුමා දක්ෂ ඇමතිවරයෙක්. දැන් සැලසුම් අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට

තිබෙනවා. එතුමාට ඒ සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමට මුදල් ඇමැතිතුමාත් මේ නගරයෙන් ඇවිත් තිබෙනවා. මේ කටයුතුවලට අදාළව උදව් කළ හැකි තවත් ඇමැතිවරු රාශියක් මෙතැන සිටිනවා. තවත් කරුණු කිහිපයක් සඳහන් කළ යුතුව තිබෙනවා. චම්පික රණවක ඇමැතිතුමා පැවසූ අන්දමට ජීවත් වීමට පුළුවන් තත්ත්වයේ නිවාස මෙහි සෑදිය යුතුයි. එතුමාගේ ඉලක්කය නිවාස 25,000 වුණත්, අපේ ඉලක්කය කෙසේ හෝ සල්ලි සොයාගෙන එම ප්‍රමාණය 40,000 දක්වා වැඩිකිරීමයි.

මුජිබර් රහ්මන් මන්ත්‍රීතුමා පාසැලක් ගැන සඳහන් කරනවා. ඒ පාසැල ඉදිකරන්න මට සුදුසු ඉඩමක් සොයා දෙන්න. මුදල් සොයල දෙන්නම් කියල මම එතුමාට කියන්න කැමැතියි. එය අපට දියුණු කිරීමට වගේම ඉදිරියට ගෙන යන්නත් පුළුවන්. තවත් ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඉදිරියට යාමට නම් මේ නගරයේ පවතින අධ්‍යාපන ක්‍රමය දියුණු කළ යුතුයි. උතුරු කොළඹ සහ මැද කොළඹ අධ්‍යාපන ක්‍රමය දියුණු කළ යුතුයි. මෙහිදී පළාත් සභා සහ මධ්‍යම රජය යනුවෙන් වෙනසක් නැහැ. පළාත් සභා ඇමැතිතුමාත් මේ ප්‍රදේශය නියෝජනය කරනවා. කිසිම ප්‍රශ්නයක් නැතිව සියලු දෙනාම එකට එක්වී මේ කටයුතු කරන්න කියල මම ඉල්ලන අතරම මේ සඳහා උදව් කරන හැටියට මම අකිල විරාජ් කාරියවසම් ඇමැතිතුමාට දන්වන්න කැමැතියි.

ජනාධිපතිතුමනි, මේ ප්‍රදේශයේ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. කෙසේ හෝ අපි එයින් බේරිය යුතුයි. මේ හැමතැනම කුඩු තිබෙනවා. ඒ කුඩු උවදුරෙන් බේරෙන්නට හැකියාවක් නැත්නම් මේ කොළඹ නගරයේ මෙවැනි සංවර්ධනයක් ක්‍රියාත්මක කිරීමෙන් පළක් නැහැ. ඒ සඳහා අපට සහාය දෙන්න. මේ පිළිබඳව මම නීතිය හා සාමය පිළිබඳ ඇමැති සාගල රත්නායක මැතිතුමාට දන්වා තිබෙනවා. අපි සියලු දෙනාම එකතු වෙලා මේ කුඩු උවදුර තුරන් කළ යුතු බව මා තරයේ කියා සිටිනවා. මේ කටයුත්තේදී ප්‍රදේශයේ ආගමික විහාරස්ථාන, පල්ලි හා කෝවිල් වල ආගමික නායකයින් එකතු වෙලා කටයුතු කරන්න ඕන. අපි ආධාර උපකාර දෙන්නම්. අපි මුදල් දෙන්නම්. ඔබ වහන්සේලා මේ සටනේ නායකත්වය අරගන්න. අපි කොංක්‍රීට්වලින් ගොඩනැගිලි හැදුවත්, රාජපක්ෂලා පන්නා දැමුවත් ඒ සියල්ල කුඩුවලින් නැති කරන්න පුළුවන්. කුඩුකාරයන් කවුදැයි හඳුනා ගෙන තවදුරටත් නීති රීති ගෙනැවිත් ඔවුන් සිරගත කළ යුතුයි. මේ වසන්ගතය දුරු කළ යුතුයි. මේ නගරය බේරා ගත හැක්කේ ඒ අන්දමින් කටයුතු කිරීමෙන් පමණයි.

එසේ කටයුතු කරන අතරතුරේ චම්පික රණවක ඇමැතිතුමාත්, රවී කරුණානායක ඇමැතිතුමාත් එක්ව මේ නගරය හදලා දේවි. ඒ සඳහා අපි ඉදිරියට යා යුතුයි. අද අපට අවශ්‍ය වන්නේ සෑම දෙනාටම අයිතිය ලබාදීමටයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවතින මේ ජාතික ආණ්ඩුව නාගරික ජනතාවට පමණක් නොව මේ අවුරුද්ද අවසන් වෙන්න පෙර රජයේ ඉඩම්වල පදිංචි වී සිටින ග්‍රාමීය ජනතාවටත් සින්නක්කර ඔප්පු ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

දැන් සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම අවුරුදු 13 ක අධ්‍යාපනයක් අඛණ්ඩව ලබාදීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව කටයුතු කර ගෙන යනවා. අපි දන්නා පරිදි දකුණු කොළඹින්, නැගෙනහිර කොළඹින්, බටහිර කොළඹින් සාමාන්‍ය පෙළ සමත් වන සිසුන් 90% ක් උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබනවා. මේ පැත්ත ගැන බැලුවොත් සාමාන්‍ය පෙළෙන් විභාගය අසමත්ව 50% ක් ඉවත් වෙනවා. මේ තත්ත්වය නතර කළ යුතුයි. සෑම දෙනෙකුටම පාසලේ තවත් අවුරුදු 2 ක් ඉගෙන ගෙන තමන් ප්‍රියකරන තමන්ට කැමැති විෂයයක් හදාරන්නට පුළුවන්. උසස් පෙළ සමත් වෙලා විශ්ව විද්‍යාලයට යෑමට අවශ්‍ය නැහැ. තමන් දක්ෂ විෂයයන්, කාර්මික අංශයේ විෂයයන් පාසලේ රැඳී සිටිමින් ඉගෙනගත හැකියි. තමන්ගේ දක්ෂකම් අනුව ඉදිරියට යා හැකි අන්දමේ විප්ලවයක් බිහි කිරීම අපේ අරමුණයි.

ඒ වගේම මේ රටේ මධ්‍යම පන්තිය ශක්තිමත් කළ යුතුයි. ඒ කාර්ය භාරය ඉටු කිරීමට පළමු වරට ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ රටේ ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු වී තිබෙනවා. මෙය අප ලෝකයට දෙන සංඥාවක්. අපට එකට එක්වී මේ රට දියුණු කරන්නට පුළුවන්. ආයෝජකයින් එන්නේ ඒ නිසයි.

හැමදාම පාගමනෙන්,  ත්‍රීරෝද රථයෙන් යන්නෙත්, මේ මිනිසුන්. පාගමන්කාරයෝ මේ අයයි. වෙන කවුරුවත් නොවේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමග එකට එකතුවී අපි ඓතිහාසික ගමනක් ආරම්භ කළා. ඒ ගමනට ශක්තිමත් අඩිතාලමක් දමමින් මේ කටයුතු ඉදිරියට ගෙන ගිය හොත් අනාගතයේදී එහි ප්‍රතිඵල භුක්ති විඳින්නට මේ රටේ සාමාන්‍ය ජනතාවට හැකි වනවා. එම නිසා ඉදිරි වසර පහ තුළ මේ රජය ආරක්ෂා කර දෙන්න, ඉතිරි වැඩ කටයුතු ටික අපි කරන්නම් කියා කොළඹ ජනතාවගෙන් ඉල්ලා සිටිමින්, මේ කටයුතු සඳහා කැපවී කටයුතු කළ අමාත්‍ය චම්පික රණවක ඇමැතිතුමාට මගේ ස්තුතිය පිරිනමමින් මාගේ කතාව අවසන් කරනවා.